# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS


ගරු අග්‍රාමාත්‍ය,
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය,
දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

2022-10-27

ගරු අග්‍රාමාත්‍යතුමනි,

**පළාත් පාලන මැතිවරණය ක්‍රමය සංශෝධනය කිරීම හා පළාත් පාලන මැතිවරණය නියමිත කාලය තුළදී පැවැත්වීම**

පසුගිය දශක දෙකකට ආසන්න කාලය තුළදී ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලියට අදාල බොහෝ සාධනීය නීතීමය සංශෝධනයන්ට, ඔබතුමා ලබාදුන් නායකත්වය හා දායකත්වය අප බොහෝ සෙයින් අගය කරමු. මෑත කාලය තුළදී ක්‍රියාත්මකවූ මැතිවරණ ක්‍රමයේ සංශෝධනය සඳහා වූ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ සභාපතිවරයා ලෙස ඔබතුමා ලබාදුන් නායකත්වයද, මැතිවරණය නියමිත කාලය තුළ පැවැත්වීම පිළිබව විශේෂයෙන්ම (2015-2019) ඔබතුමන් සිවිල් සංවිධාන සමග ඒ සම්බන්ධව දරණ ලද උත්සාහයන්ද කෘතවේදීව සිහිපත් කරමු.

එහෙත් මේ වන විට ඔබතුමන් අග්‍රාමාත්‍ය ධූරය හා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ධූරය දරණ රජයක් යටතේ පළාත් පාලන මැතිවරණය කල්යන ආකාරයේ උපක්‍රමික සංශෝධන යෝජනා ගෙන ඒමට උත්සාහ දැරීම විශ්වාස කල නොහැකි තත්ත්වයකි. අප වෙත තොරතුරු වාර්තාවී ඇති ආකාරයට එක් දිනක් තුළ එනම් ඔක්තෝබර් මස 17 වන දිනය තුළ රාජ්‍ය ආයතන තුනක් ඉතා කාර්යක්ෂම ලෙස පළාත් පාලන මැතිවරණ ක්‍රමය සංශෝධනයට යෝජනා ඉදිරිපත් කර ඇති අතර එදිනම එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර සම්මත කරගැනීමට කටයුතු කර ඇත. මෙය රාජ්‍ය සේවයේ කාර්යක්ෂමභාවයද එසේ නොමැති නම් මැතිවරණය කල්දැමීමේ ආණ්ඩුවේ උපක්‍රමයක්ද යන්න පිළිබඳව සාධාරණ සැකයක් සමාජය තුළ මතුව ඇත.

එමෙන්ම ඔබතුමාගේ සභාපතීත්වය යටතේ ක්‍රියාත්මකවූ මැතිවරණ ක්‍රමයේ සංශෝධනය සඳහා වූ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව වෙත මැතිවරණ නිරීක්ෂණ සංවිධාන, දේශපාලන පක්ෂ, මැතිවරණ කොමිසම ඇතුලු බොහෝ පාර්ශව අදහස් දැක්වූ අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 17 දෙනෙකු හා බාහිර විශේෂඥයින් ගණනාවකගේ කාලය හා මුදල් වැයකරමින් සකස්කරන ලද වාර්තාව ඉදිරිපත්ව ගතව ඇත්තේ මාස කිහිපයකි. එවැනි වටපිටාවකදී ඔබතුමන් අග්‍රාමාත්‍ය ධූරය දරණ ආණ්ඩුවක නැවත තේරීම් කාරක සභාවක් පත්කිරීම ඔබතුමන් සභාපතීත්වය දැරූ තේරීම් කාරක සභාව අවමානයකට ලක්වීමටද හේතුවක් වනු ඇත.

මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම හෝ සභික ප්‍රමාණය අඩුකිරීම පිළිබඳව අපගේ විරෝධයක් නොමැති වුවද එය කල යුත්තේ ජනතාවගේ මතය නිවැරදිව නියෝජනය වන ආකාරයට හා එමගින් ජනතාවගේ මතය ප්‍රකාශ කිරීමට ඇති ඉඩකඩ අහිමි නොවන ආකාරයටය. මැතිවරණ ක්‍රමය සංශෝධනය කල මෑත අවස්ථා දෙකෙහිම (පළාත් පාලන මැතිවරණ ක්‍රමය, පළාත් සභා මැතිවරණ ක්‍රමය) සාධනීය සංශෝධන ඇතුළත් වුවද පැවති ආණ්ඩු ඒවා භාවිත කර මැතිවරණ කල්දැමීමට කටයුතු කල බව ඔබතුමා හොඳින්ම දන්නා කරුණකි. පළාත් සභා මැතිවරණය මේ වන විටත් වසර 5 කට ආසන්න කාලයක් මහජන නියෝජිතයින්ගෙන් තොරව ක්‍රියාත්මකවේ. එමෙන්ම පළාත් පාලන මැතිවරණයද දැනටමත් වසරකින් කල්දැමීමට කටයුතු කර ඇත.

ඔබතුමන් අග්‍රාමාත්‍ය ධූරය හා විෂය භාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන මොහොතක අප කිසිසේත්ම මෙවැන්නක් අපේක්ෂා නොකරන්නෙමු. එබැවින් අප ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ පළාත් පාලන මැතිවරණය 2023 මාර්තු මස 19 වන දිනට පෙර පැවැත්වීමට බාධාවක් වන ආකාරයේ කිසිදු ක්‍රියාමාර්ගයක් නොගන්නා ලෙසයි. මේ සම්බන්ධයෙන් ඔබතුමන් සාධනීය මැදිහත්වීමක් සිදුකරනු ඇති බවට අප තරයේ විශ්වාස කරමු.

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ

පිටපත් : ලේකම්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය / සභාපති, මැතිවරණ කොමිෂන් සභාව


#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

Honorable Dinesh Gunawardena
2022.10.27 Prime Minister, Minister of Local Government and Provincial Councils

Honorable Prime Minister

**Amending the Local Government Electoral System and holding the Local Government Election in due time**

We greatly appreciate your leadershipandthe contribution made tobring about many positive legal amendments related to the election process in Sri Lanka during the last two decades. Also, we gratefully remember the leadership provided by you as the Chairman of the Parliament Select Committee for the revision of the electoral system in the recent past and the efforts you made together with the civil organizations in connection with the holding of elections within the stipulated period particularly during 2015-2019.

However, the attempt of the government where you hold the office of Prime Minister and Minister of Local Government and Provincial Councils to bring tactical amendments to delay the local government electionsis unbelievable.According to the information reported to us,three government institutions have very efficiently presented the proposals to amend the Local Government System within one day i.e. on the 17th of October and submitted to the Cabinet to have them adopted on the same day. A reasonable doubt has arisen in the society as to whether this was due to the efficiency of the public service, or whether it is a tactic of the government to postpone the election.

Also, it is only a few months since the report of the Parliamentary Select Committee for the amendment of the electoral system, which was implemented under your chairmanship and involvement of several parties, including the Election Monitoring Commission who had testified before the Select Committee expressing their ideas and views while the report has been prepared after spending the time and money of 17 members of parliament and a number of external experts. In such an environment, appointing a select committee againby the government in which you hold the post of Prime Minister will invariably humiliate the integrity of the Select Committee chaired by you.

We have no objection in amending the Electoral System or reducing the number of Councilors; but it should be done in such a manner that the opinion of the people is properly represented and the opportunity to express the opinion of the people is not lost. It is a fact that you are well aware that in two recent cases where the electoral system was revised (theProvincial Council Electoral Systemand theLocal Government Electoral System) despite the inclusion of positive amendments the governments have used them to postpone the elections. The Provincial Councils have been running without public representatives for almost 5 years now. Also, the local government elections have already been postponed by a year.

We do not expect such a situation to prevail at all, particularly at a time when you are the Prime Minister and the Minister in charge of the subject. Therefore, we request you to refrain from taking any action that would hinder the holding of the Local Government Elections before 19 March 2023. We strongly believe that you will make a positive intervention in this regard.

Rohana Hettiarachi
Executive Director
Copies: Secretary, Ministry of Provincial Councils and Local Government/
Chairman of the Election Commission.